# සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උපාධිධාරීන්ගෙන් හා ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන්ගෙන් (සිංහල/දෙමළ මාධ්‍යය) අයදුම්පත් කැඳවීම - 2017.

සබරගමුව පළාතේ පළාත් සභාවට අයත් පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියට උපාධිධාරීන් සහ 3-I(ඇ) ශ්‍රේණියට ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන් (සිංහල/දෙමළ මාධ්‍යය) දිස්ත්‍රික් පදනම මත බඳවා ගැනීම පිණිස සබරගමුව පළාත් උපාධිධාරීන්ගෙන්/ ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01) **යෝග්‍යතා :-**

අ. සාමාන්‍ය සුදුසුකම් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iii. 2017.03.10 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
**iv.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට එනම් 2017.03.10 දිනට පූර්වාසන්න, සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී තම ස්ථිර පදිංචිය ග්‍රාම සේවා සහතික හෝ අදාල වෙනත් ලියවිලි මගින් සනාථ කල යුතු වේ.)

ආ. අධ්‍යාපන සුදුසුකම් :

i. අයදුම් කරනු ලබන සියළුම උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2017.03.10 දිනට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමෙන ආයතනයකින් උපාධියක් ලබා තිබිය යුතු අතර, ඉංග්‍රීසි පුරප්පාඩු සඳහා අයදුම්කරන ඩිප්ලෝමාධාරීන් 2017.03.10 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දෑ අවුරුදු, ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. එම උපාධියට/ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයයන් වලට අනුකූලව එක් එක් විෂය සඳහා උප ලේඛන අංක I හි සඳහන් සුදුසුකම් සමග පහත ii හි සුදුසුකම සපුරා තිබීම අනිවාර්යය වේ.

ii. අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිගත් ප්‍රතිපත්තිය මත අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාගය පහත සඳහන් පරිදි සමත්ව තිබිය යුතුය.

- ❖ අ.පො.ස.(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව, සම්මාන 03ක් සහිතව විෂයන් 06 කින් සමත්වීම.
- ❖ අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් නව නිර්දේශය යටතේ විෂයයන් 03 (පොදු පරීක්ෂණය හැර) එක්වරකදී සමත්වීම.

(සටහන : විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම්කල හැකිය).

## උපලේඛනය අංක I

| විෂය කේත අංකය | පුරප්පාඩු විෂය | අධ්‍යාපන සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | රත්නපුර දිස්ත්‍රික්කය | | කෑගල්ල දිස්ත්‍රික්කය | |
| | | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය |
| 11 | ප්‍රාථමික | පිළිගත් විශ්ව විද්‍යාලයකින් මව්බස (සිංහල/දෙමළ) පිළිබඳව ලබාගත් විශේෂවේදී උපාධිය<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධිය | 32 | 48 | 10 | 20 |
| 22 | සිංහල භාෂාව (උ/පෙළ) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සිංහල විශේෂවේදී උපාධිය | 07 | - | 03 | - |
| 33 | දේශපාලන විද්‍යාව (උ/පෙළ) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් දේශපාලන විද්‍යාව විශේෂවේදී උපාධිය | 07 | 02 | 03 | 02 |
| 44 | ඉතිහාසය (උ/පෙළ) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉතිහාසය විශේෂවේදී උපාධිය | 11 | 02 | 05 | 03 |
| 55 | භූගෝල විද්‍යාව (උ/පෙළ) | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් භූගෝල විද්‍යාව විශේෂවේදී උපාධිය | 05 | - | 08 | 01 |
| 66 | ඉංග්‍රීසි භාෂාව | උපාධිධාරියෙකු නම් ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය/ඉංග්‍රීසි විෂය ඉගැන්වීම ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ලබාගත් උපාධියක් ලබා තිබිය යුතුය (ඉංග්‍රීසි මාධ්‍යයෙන් වෙනත් උපාධියක් හදාරා තිබීම සුදුසුකමක් නොවේ).<br>ඩිප්ලෝමාධාරියෙකු නම් අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම සමග, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දෑ අවුරුදු (පූර්ණ කාලීන/අර්ධ කාලීන) ඩිප්ලෝමාවක්, ලබා තිබිය යුතුය.<br>හෝ<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබීම සමග, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම (දේශීය/විදේශීය) විශ්ව විද්‍යාලයකින් පිරිනමනු ලබන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දෑ අවුරුදු (පූර්ණ කාලීන/අර්ධ කාලීන) ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. | 28 | 12 | 10 | 16 |
| 77 | බෞද්ධ ශිෂ්ටාචාරය/ බෞද්ධ සංස්කෘතිය (උ/පෙළ) | පුරප්පාඩු විෂයයට අදාලව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් විශේෂවේදී උපාධිය<br>හෝ<br>පුරප්පාඩු විෂයය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් සාමාන්‍යවේදී උපාධිය සමග ධර්මාචාර්ය අවසන් විභාගය සමත් වී තිබිය යුතුය. | 08 | - | 08 | - |
| 88 | චිත්‍ර කලාව | පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුරප්පාඩු විෂය ප්‍රධාන විෂයයක් සහිතව ලබාගත් සාමාන්‍යවේදී හෝ විශේෂවේදී උපාධිය | 32 | 12 | 21 | 08 |

02) <u>බඳවා ගැනීමේ ක්‍රමය සහ සේවා කොන්දේසි :-</u>

2:1 උප ලේඛන අංක I පරිදි ඒ ඒ දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පමණක් මෙම බඳවා ගැනීම් සිදු කෙරෙන අතර **(කෙසේ වෙතත් පවතින ප්‍රතිපාදන මත බඳවා ගන්නා දිනට ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාවද සලකා බලනු ඇත)**, මෙම දැන්වීමට අදාලව 01.අ. හා 01.ආ. හි සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පත්වීම් බලධරයා විසින් නියම කරනු ලබන පරිදි විභාග කොමසාරිස් ජනරාල් විසින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා තරඟ විභාගයක් පවත්වනු ලැබේ. එම විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය මත සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කරනු ලැබේ. ඒ අනුව ඔවුන් ලබාගන්නා මුළු ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාවය අනුව දිස්ත්‍රික් මට්ටමින් පවතින ගුරු පුරප්පාඩු සඳහා පත්වීම් ලබාදීමට සුදුස්සන් තෝරාගනු ලැබේ. (අයදුම්කරුවන් විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාලව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය.) ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබාදෙනු ඇත.

| **අනු අංකය** | **ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| 1. | අරමුණ හා ප්‍රවිෂ්ට වීම. | 05 | 02 |
| 2. | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 3. | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 4. | කාල කළමනාකරණය. | 05 | 02 |
| 5. | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | 10 |

මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් නොමැති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලා ඇති නමුත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතිකපත් සම්බන්ධව පසුව සලකා බලනු නොලැබේ.

2:2 මෙම නිවේදනයට අදාලව පුරප්පාඩු පවතින්නේ නගරාශ්‍රිත ප්‍රදේශවලින් බැහැර දුෂ්කර ප්‍රදේශවල පාසල්වලය. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අයදුම්කරුවන්ට අදාල පුරප්පාඩු ලේඛනය ප්‍රදර්ශනය කරනු ලැබේ. ඒ අනුව අයදුම්කරුවන් විසින් එම අවස්ථාවේදී පුරප්පාඩු පවතින පාසල් සඳහා පත්වීම් ලබාගැනීමට ඇති ස්වකීය මනාපය අනුපිළිවෙලින් දැක්විය යුතුය.

2:3 මෙම බඳවා ගැනීම් දිස්ත්‍රික් මට්ටමින් පාසල් පාදකව සිදුකෙරේ. එකම පුරප්පාඩු පාසල සඳහා අයදුම්කරුවන් කිහිපදෙනෙකු ඉදිරිපත්වී ඇති අවස්ථාවකදී, තරඟ විභාගයේදී ලබාගන්නා ලද ලකුණුවල හෝ ප්‍රායෝගික පරීක්ෂණයේදී ලබාගන්නා ලද ලකුණුවල ප්‍රමුඛතාවය සලකා බලනු ලැබේ. එකම පුරප්පාඩුවක් සඳහා ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් කිහිපදෙනෙකු සමාන ලකුණු ලබා ඇති අවස්ථාවකදී අයදුම්කරුවන්ගේ ස්ථිර පදිංචි ස්ථානයේ සිට එම පාසලට ඇති දුර ප්‍රමාණය අනුව ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

2:4 දිස්ත්‍රික් මට්ටමින් ලැබෙන සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අවස්ථාවකදී, තරඟ විභාගයකින් තොරව සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායෝගික පරීක්ෂණයකට අයදුම්කරුවන් භාජනය කර සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

2:5 අදාල දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන, සුදුසුකම් ලත් අයදුම්පත් ප්‍රමාණයක් එම දිස්ත්‍රික්කයෙන් ලැබී නොමැති වුවහොත් පමණක් යාබද දිස්ත්‍රික්කයේ (රත්නපුර/කෑගල්ල) සුදුසුකම් ලත් අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ඇත.

2:6 රජයේ/පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරීන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I(අ) ශ්‍රේණියටත්, ඩිප්ලෝමාධාරීන් 3-I(ඇ) ශ්‍රේණියටත් පත් කරනු ලැබේ.

2:7 මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2006 අනුව වන අතර, මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජීඊ-1-2006 දරණ වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව **රු.27,740-300x6-380x7-445x2-රු.33,090/=** ක් වේ. උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු 18872/- මාසික වැටුප මත ද, ඩිප්ලෝමාධාරීන් මෙම වැටුප් පරිමාණයේ 07 වන පියවර වන රු 17332/- මාසික වැටුප මත ද පිහිටවනු ලැබේ. වැටුප් ගෙවීම් සිදුකරනු ලබන්නේ එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් විධිවිධාන අනුව වේ.

2:8 මෙම බඳවා ගැනීම් පාසල් පාදකව සිදුකෙරෙන බැවින් සෑම අයෙකුම මුල් පත්වීම ලබන පාසලේ අවම වශයෙන් අඛණ්ඩව වසර 05ක් අනිවාර්යයෙන්ම සේවය කල යුතු අතර, එම කාල සීමාව තුලදී ස්ථාන මාරු හිමිකම් නොලැබේ. තවද සබරගමුව පළාත තුල අනිවාර්යයෙන්ම අවම වශයෙන් වසර 10ක් සේවය කල යුතුය. මෙම කාල සීමාව තුල කුමන හෝ හේතුවක් මත ජාතික පාසල් හෝ අන්තර් පළාත් ස්ථාන මාරුවීම් ලබා දෙනු නොලැබේ. එහෙත් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන් මත ඕනෑම අවස්ථාවක පළාත තුල ඕනෑම පාසලකට ස්ථාන මාරු කිරීමේ බලය සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු වේ. පත්වීම් ලබන සියළුම පත්වීම්ලාභීන් සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම් සමග මේ පිළිබඳව ගිවිසුමකට එළඹිය යුතුය.

2:9 මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. 2014.10.23 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.2 හා 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම පුවත්පත් නිවේදනයෙන් ආවරණය නොවන්නාවූ යම් කරුණක් වේනොත් එම අවස්ථා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධාන වලට යටත්වනු ඇත.

03) **<u>ඉල්ලුම් කිරීමේ ක්‍රමය</u> :-**

3:1 ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපිටම භාවිත කරමින් මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් සකස් කරගත යුතුය. අයදුම් පත්‍රයේ 01 සිට 3:6 තෙක් ඡේද මුල් පිටුවේත් ඉතිරිය දෙවන පිටුවේත් සඳහන් විය යුතුය. අදාළ ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා සෑම ආකාරයෙන්ම අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක). ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍රය පුවත්පත් නිවේදනයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලවම ඉදිරිපත් කිරීම අපේක්ෂකයාගේ වගකීමකි. එමෙන්ම අයදුම්පත්‍රය සකස් කර ගැනීමේදී එහි ශීර්ෂයේ සඳහන් නම, සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ ඉල්ලුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

3:2 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරණ නිලධාරියෙකු, දීප ව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු හෝ රු. 240360/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

3:3 දැනට රැකියාවක නිරත වන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් ඉල්ලුම් කල යුතුය.

3:4 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.03.10 දිනට හෝ ඊට පෙර **"ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහල කෙළවරේ **"සබරගමුව පළාත් ගුරු පුරප්පාඩු සඳහා අයදුම් කිරීම - 2017"** යනුවෙන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

3:5 එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත්කල හැක්කේ එක් අයදුම්පතක් පමණි. සෑම ආකාරයකින් සම්පූර්ණ නොවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, අයදුම්පත් ලැබී ඇති බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. තැපෑලේදී නැති වන හෝ ප්‍රමාද වන හෝ අයදුම් පත් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම් කරනු ලබන පාසල් අනුපිළිවෙල කිසිසේත් වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා

සලකා බලනු නොලැබේ. තවද, උපාධියට/ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් යටතේ පමණක් අයදුම් කළයුතු අතර, පත්වීම් ලබන පාසල හෝ පත්වීම් විෂය කිසිදු හේතුවක් නිසා වෙනස් කරනු නොලැබේ.

04) **විභාග පටිපාටිය :-**

4:1 ඉහත 01 වන කොන්දේසියට අනුව සුදුසුකම් සපුරන ලද අපේක්ෂකයන්හට පමණක් විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අපේක්ෂකයා එහි තම අත්සන සහතික කරවා ගත යුතු අතර, විභාගයට පෙනී සිටින පළමු දිනයේ විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත සිය අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කල යුතුය. එසේ ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත් නිකුත් කල වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තු ගෙවීමට අදාල ලදුපතේ පිටපත ද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වන ඇත.

4:2 අපේක්ෂකයෙකු තමන්හට නියම කරන ලද විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

4:3 විභාග මධ්‍යස්ථානයේදී විභාග අපේක්ෂකයාගේ අනන්‍යතාවය විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් බව සැලකිය යුතුය.

4:4 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

4:5 මෙම විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පමණක් පවත්වනු ලැබේ. විභාගයට අයදුම් කරනු ලබන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ නොලැබේ.

4:6 ඒ අනුව විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍ර දෙකම බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න වලින් යුක්තය.

01. අභියෝග්‍යතා පරීක්ෂණය - කාලය පැය 01 යි (ලකුණු 100 යි)
    අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.

02. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි (ලකුණු 100 යි)
    ගුරු ක්ෂේත්‍රයට අදාලව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

4:7 මෙම ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් හෝ ඊට ඉහල ලකුණු ලබා ගෙන විෂයයන් දෙකම සමත් විය යුතුය. එසේ ලබා ගත් අයදුම්කරුවන්ගේ ප්‍රමුඛතා ලේඛනයක් සකස් කොට විභාග කොමසාරිස් ජනරාල් විසින් සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම් වෙත ලබා දෙනු ඇත. තවද විභාගයට පෙනී සිටින සියළුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යවනු ඇත.

05) <u>විභාග ගාස්තු :-</u>

විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ අංක 20.03.02.99 දරණ ආදායම් ශීර්ෂයට බැරවන පරිදි සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ ඕනෑම දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කර එවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත).

06) <u>විභාග මධ්‍යස්ථාන :-</u> මෙම විභාගය පහත දැක්වෙන නගර වලදී පැවැත්වෙනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල් විසින් පසුව දැනුම් දෙනු ඇත.

| නගරය | නගර අංකය |
|---|---|
| රත්නපුර | 01 |
| කෑගල්ල | 02 |

07) කිසියම් අයදුම්කරුවෙකු සුදුසුකම් සපුරා නොමැති බව පත්වීම් ලැබීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද නියමිත සුදුසුකම් පිළිබඳව දැන දැනම හෝ ඕනෑකමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව හෝ පත්වීම් ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් හෝ පත්කිරීම සඳහා ඔබ නුසුදුසු බව හෝ අනාවරණය වුවහොත්, වහාම රජයේ සේවයෙන් පහ කරනු/සේවය අවසන් කරනු ලැබේ.

08) උපලේඛන අංක I හි සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සඳහා පමණක් දිස්ත්‍රික් පදනම මත මෙම නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇති අතර, එබැවින් මෙම නිවේදනයට අදාලව අයදුම්පතක් ඉදිරිපත් කිරීම, අදාල තරඟ විභාගයට පෙනී සිටීම හෝ ඉන් සමත්වීම, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම හෝ ඊට ඉදිරිපත් වීම යන කිසිදු කරුණක් හෝ වෙනයම් ඕනෑම කරුණක් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා වන අයිතිවාසිකමක් හෝ නීත්‍යානුකූල හිමිකමක් නොවන්නේය.

09) මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද පුරප්පාඩුවලින් කොටසක් හෝ මුලුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද සබරගමුව පළාත් අධ්‍යාපන ලේකම් සතුය.

මහින්ද එස්.වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

2017.02.15
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර.

# <u>ආදර්ශ අයදුම් පත්‍රය</u>

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

**<u>සබරගමුව පළාත් සභාවේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා උපාධිධාරීන්ගෙන් හා ඉංග්‍රීසි පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමාධාරීන්ගෙන් (සිංහල/දෙමළ මාධ්‍යය) අයදුම්පත් කැඳවීම - 2017.</u>**

**<u>Calling For Applications From The Graduates/ Diploma (Two Year) Holders In English To Fill The Exsisting Vacancies Of The Schools In Sabaragamuwa Province – 2017.</u>**

- විභාගයට පෙනී සිටින නගරය [ ] නගර අංකය [ ]
  (රත්නපුර - 01, කෑගල්ල - 02)
- විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත මාධ්‍යය [ ]
  (සිංහල - 01, දෙමළ - 02) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
- ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය [ ] දිස්ත්‍රික් අංකය [ ]
  (රත්නපුර - 01, කෑගල්ල - 02)
- ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය [ ]

- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයට/විෂයයන්ට අනුව පත්වීම ලැබීමට අයදුම් කරන විෂයය, විෂය කේත අංකය, දිස්ත්‍රික්කය හා මාධ්‍යය අදාල කොටුව තුළ ලියන්න (උපලේඛනය I අනුව සම්පූර්ණ කල යුතුය)

| අනු අංකය | විෂය කේත අංකය | විෂය | මාධ්‍යය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

1). 1:1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් (උදා :- PERERA A.B.)
.....................................................................................................................................................
1:2 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම සිංහලෙන්/දෙමළෙන්
.....................................................................................................................................................
1:3 මුලකුරු වලින් දැක්වෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) ..........................................................
.....................................................................................................................................................

2). 2:1 වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්).................................................................................
.....................................................................................................................................................
2:2 වර්තමාන ලිපිනය : (සිංහලෙන්/දෙමළෙන්) (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) .....................
.....................................................................................................................................................
2:3 දුරකථන අංකය : ජංගම....................................... නිවස.......................................

3). 3:1 ජාතික හැඳුනුම්පත් අංකය : [ ]

3:2 උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

3:3 2017.03.10 දිනට වයස : අවු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

3:4 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ] (ස්ත්‍රී - 1, පුරුෂ - 2 ) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3:5 විවාහක/අවිවාහක බව : [ ] (අවිවාහක - 1, විවාහක - 2 ) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3:6 ජන වර්ගය : [ ] (සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 3, බර්ගර් - 4, වෙනත් - 5) (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4). අධ්‍යාපන සුදුසුකම් : **(විභාග ප්‍රතිපල ලේඛනවල සහතික කල පිටපත් අමුණා එවීම අනිවාර්යය වේ.)**

4:1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| | සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|---|
| පළමු වර | | |
| දෙවන වර | | |

| | විෂයය | පළමුවර සාමාර්ථය | දෙවනවර සාමාර්ථය |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

4:2 අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| සමත් වූ වර්ෂය | විභාග අංකය |
|---|---|
| | |

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

4:3 උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :

අ. උපාධිය/ඉංග්‍රීසි පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ඩිප්ලෝමාව : ........................................................................

ආ. නිකුත් කළ විශ්ව විද්‍යාලය/ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය : .......................................................

ඇ. උපාධිය/ ඩිප්ලෝමාව වලංගු දිනය : ........................................................................................

ඈ. උපාධියට/ ඩිප්ලෝමාවට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් : ..........................:................................

**(උපාධියට/ඩිප්ලෝමාවට අදාල විභාග තොරතුරු ලේඛනයේ (Detail Certificate/Academic Transcript) සහතික කල පිටපතක් අමුණා එවීම අනිවාර්යය වේ)**

5). 5:1 ගෙවා ඇති විභාග ගාස්තුව රුපියල් (අකුරින්) : ..........................................................................

5:2 කුවිතාන්සියේ අංකය :........................................................

5.3 නිකුත් කල කාර්යාලය :.................................................. 5:4 දිනය :..................................................

| **කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න. මුදල් කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.** |
|---|

6). අයදුම්කරුගේ/අයදුම්කාරියගේ ප්‍රකාශය : මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මාවිසින් සපයා ඇති තොරතුරු අසම්පූර්ණ හෝ අසත්‍ය බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, පසුව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.................................... ...................................................

දිනය අයදුම්කරුගේ/කාරියගේ අත්සන

7). අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................. ස්වාමීන් වහන්ස/මයා/මිය/මෙය මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ................................ දින ඔහුගේ ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවද එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.................................... ............................................

දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

8). අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය : .................................. ......................... ස්වාමීන්වහන්ස/මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් දන්වමි.

දිනය :................................... ...........................................................

තනතුර :.................................................... දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :...................................

(නිල මුද්‍රාව)

# NOTICE

## FILLING OF TEACHER VACANCIES SABARAGAMUWA PROVINCE

### Ministry of Education, Information Technology & Cultural Affairs Sabaragamuwa Province

Applications are invited from Sabaragamuwa Provincial Graduates/ two year English Diploma holders to fill teacher vacancies in schools of Sabaragamuwa Provincial Council by grade 3 - 1 (A) graduates and grade 3 - 1 (b) two year English Diploma holders (Sinhala / Taml media) on District Basis. Closing date of applications is **10.03.2017**.

**Schedule 1**

| Subject Code No. | Subject Vacant | Educational qualifications | Number of Vacancies | | | |
|---|---|---|---|---|---|---|
| | | | Ratnapura District | | Kegalle District | |
| | | | Sinhala Medium | Tamil Medium | Sinhala Medium | Tamil Medium |
| 11 | Primary | Special Degree in mother tongue (Sinhala / Tamil) obtained from a recognized University<br>OR<br>Bachelor of Education degree obtained from a recognized University<br>OR<br>Special degree in Psychology obtained from a recognized University | 12 | 48 | 10 | 20 |
| 22 | Sinhala Language (A/Level) | Special degree in Sinhala obtained from a recognized University | 07 | - | 03 | - |
| 33 | Political Science (A/Level) | Special Degree in political Science obtained from a recognized University | 07 | 02 | 03 | 02 |
| 44 | History (A/Level) | Special Degree in History obtained from a recognized University | 11 | 02 | 05 | 03 |
| 55 | Geography (A/Level) | Special Degree in Geography obtained from a recognized University | 05 | - | 08 | 01 |
| 66 | English Language | In case of a graduate, should have obtained a degree in English language / English Literature / English teaching / as main subject (studying for any other degree in English is not a qualification)<br>In case of a Diploma Holder should have obtained requirement of credit (C) pass at GCE ( Ord/Level) examination in two occasions with a (full time) / part time) 2 year diploma in English language awarded by Sri Lanka Institute for advanced Technology (SLIATE).<br>OR<br>Should have obtained minimum credit (C) pass for English at GCE (OL) examination in two occasions with a two year Diploma in English from any (Local/Foreign) University recognized by the University Grants Commission. | 28 | 12 | 10 | 16 |
| 77 | Buddhist Civilization/ Buddhist Culture (A/Level) | Special Degree obtained from a recognized University relevant to subject of Vacancy<br>or<br>General Degree with subject of vacancy as main subject with a pass in Dharmacharya Final examination. | 08 | - | 08 | - |
| 88 | Art | General or special degree with subject of vacancy as main subject obtained from a recognized University. | 32 | 12 | 21 | 08 |

Applicants expecting to apply on qualifications indicated in schedule No. 1 of this notice, may log into the official website of the Sabaragamuwa Provincial Council, **www.sg.gov.lk** or **Face Book//:Sab Education Ministry** of the Provincial Ministry of Education, and examine relevant details and qualifications and submit an application prepared according to the specimen application given, following the given instructions.

**Mahinda S. Weerasooriya**
**Secretary,**
**Ministry of Education, Information Technology & Cultural Affairs**
**Sabaragamuwa.**

15.02.2017

# அறிவித்தல்

## சப்ரகமுவ மாகாணத்தின் ஆசிரியர் வெற்றிடங்களைப் பூர்த்தி செய்தல்

### கல்வி, தகவல் தொழில்நுட்பம் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

### சப்ரகமுவ மாகாணம்

சப்ரகமுவ மாகாணத்தின் மாகாண சபைக்குச் சொந்தமான பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களைப் பூர்த்தி செய்யும் முறைமையின் கீழ், கீழ்க்காணும் இலக்கம் 1இல் குறிப்பிடப்பட்டுள்ள வெற்றிடத்திற்காக இலங்கை ஆசிரியர் சேவை சாசனத்திற்கமைவாக இலங்கை ஆசிரியர் சேவையின் 3-1 (அ) தரத்திற்கு பட்டதாரிகள் மற்றும் 3-1 (ஆ) தரத்திற்கு ஆங்கிலம் தொடர்பான இரண்டு வருட டிப்ளோமா பட்டதாரிகள் (சிங்களம்/ தமிழ் மொழி மூலம்) மாவட்ட மட்டத்தில் சேர்த்துக் கொள்ளப்படுவதற்காக சப்ரகமுவ மாகாணத்தின் பட்டதாரிகளிடமிருந்து/ ஆங்கிலம் தொடர்பான இரண்டு வருட டிப்ளோமா பட்டதாரிகளிடமிருந்து விண்ணப்பங்கள் கோரப்படுகின்றன. விண்ணப்பங்கள் பொறுப்பேற்கப்படும் இறுதித் திகதி 2017.03.10 ஆகும்.

**அட்டவணை 1**

| பாட குறியீட்டு எண் | பாட வெற்றிடம் | கல்வித் தகைமைகள் | வெற்றிடத் தொகை | | | |
|---|---|---|---|---|---|---|
| | | | இரத்தினபுரி மாவட்டம் | | கேகாலை மாவட்டம் | |
| | | | சிங்கள மொழி மூலம் | தமிழ் மொழி மூலம் | சிங்கள மொழி மூலம் | தமிழ் மொழி மூலம் |
| 11 | ஆரம்ப நிலை | அங்கீகரிக்கப்பட்ட பல்கலைக்கழகமொன்றிலிருந்து தாய் மொழி (சிங்களம்/ தமிழ்) தொடர்பாக பெற்றுக் கொள்ளப்பட்ட விசேட பட்டதாரிப் பட்டம் அல்லது அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகமொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட கல்வியியல் பட்டதாரிப்பட்டம் அல்லது அங்கீகரிக்கப்பட்ட பல்கலைக்கழக மொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட உளவியல் தொடர்பான விசேட பட்டதாரிப்பட்டம் | 32 | 48 | 10 | 20 |
| 22 | சிங்கள மொழி (உ/தரம்) | அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகமொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட சிங்கள விசேட பட்டதாரிப் பட்டம் | 07 | - | 03 | - |
| 33 | அரசியல் (உ/தரம்) | அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகமொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட அரசியல் விசேட பட்டதாரிப் பட்டம் | 07 | 02 | 03 | 02 |
| 44 | வரலாறு (உ/தரம்) | அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகமொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட வரலாறு தொடர்பான விசேடமான பட்டதாரிப்பட்டம் | 11 | 02 | 05 | 03 |
| 55 | புவியியல் (உ/தரம்) | அங்கீகரிக்கப்பட்ட பல்கலைக்கழகமொன்றிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட புவியியல் விசேட பட்டதாரிப்பட்டம் | 05 | - | 08 | 01 |
| 66 | ஆங்கில மொழி (உ/தரம்) | பட்டதாரியொருவரானால் ஆங்கில மொழி/ ஆங்கில இலக்கியம்/ ஆங்கிலப் பாடம் கற்பிப்பதில் பிரதான பாடமொன்றிற்காக பெற்றுக்கொள்ளப்பட்ட பட்டதாரிப்பட்டத்தைக் கொண்டிருத்தல் வேண்டும். (ஆங்கில மொழி மூலமாக ஏதாவதொரு பட்டதாரிப் பட்டமொன்றைப் பெற்றிருப்பது தகுதியாகாது) | 28 | 12 | 10 | 16 |
| | | டிப்ளோமா பட்டதாரியொருவரானால் க.பொ.த (சா/தரம்) பரீட்சையில் இரண்டு அமர்வுகளுக்கு மேற்படாத தவணைகளில் ஆங்கிலப் பாடத்திற்காக ஆகக் குறைந்தது திறமைச்சித்தி (C) யைப் பெற்றிருப்பதுடன், இலங்கை உயர் தொழில்நுட்பவியல் கல்வி நிலையத்தினால் (SLIATE) வழங்கப்படும் ஆங்கில மொழிதொடர்பாக இரண்டு வருட (முழுநேர/ பகுதிநேர) டிப்ளோமாவைப் பெற்றிருத்தல் வேண்டும் | | | | |
| | | க.பொ.த (சா/தரம்) பரீட்சையில் இரண்டு அமர்வுகளுக்கு மேற்படாத தவணைகளில் ஆங்கிலப் பாடத்தில் ஆகக் குறைந்தது திறமைச் சித்தியைப் (C) பெற்றிருப்பதுடன், பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவினால் அங்கீகரிக்கப்பட்ட எந்தவொரு (உள்நாட்டு/ வெளிநாட்டு) பல்கலைக் கழகத்தினால் வழங்கப்படும் ஆங்கில மொழி தொடர்பான இரண்டு வருட (முழு நேர/ பகுதிநேர) டிப்ளோமாவைப் பெற்றிருத்தல் வேண்டும். | | | | |
| 77 | பௌத்த நாகரீகம்/ பௌத்த கலாசாரம் (உ/தரம்) | வெற்றிடமாகக் காணப்படும் பாடங்களுடன் தொடர்புற்ற அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழகமொன்றிலிருந்து பெற்றுக் கொள்ளப்பட்ட விசேடத்துவ பட்டதாரிப் பட்டம் அல்லது வெற்றிட பாடங்களில் பிரதான பாடங்களுடன் பெற்றுக்கொண்ட சாதாரண பட்டத்துடன் தர்மாச்சாரி கடைசி பரீட்சையில் சித்தியடைந்திருத்தல் வேண்டும். | 08 | - | 08 | - |
| 88 | ஓவியக் கலை | அங்கீகரிக்கப்பட்ட பல்கலைக் கழக மொன்றிலிருந்து வெற்றிட பாடங்களில் பிரதான பாடங்களுடன் பெற்றுக்கொண்ட சாதாரண பட்டத்துடன் தர்மாச்சாரி கடைசி பரீட்சையில் சித்தியடைந்திருத்தல் வேண்டும். | 32 | 12 | 21 | 08 |

இவ் அறிவித்தலின் பிரகாரம் மேற்படி 1ஆம் இலக்க உட்டவணையில் குறிப்பிடப்பட்டுள்ள தகைமைகள் மீது விண்ணப்பிக்க உத்தேசித்துள்ள அனைத்து விண்ணப்பதாரர்களும் சப்ரகமுவ மாகாண சபையின் இணையத்தளமான www.sg.gov.lk இற்கு அல்லது மாகாண கல்வி அமைச்சில் Facebook//:Sab Educationministry இற்கு பிரவேசித்து குறித்த விபரம் மற்றும் தகைமைகளைப் பரீட்சித்து, மேற்படி அறிவுரைகளைக் கவனத்திற்கொண்டு, காட்டப்பட்டுள்ள விண்ணப்பப்படிவத்திற்கு அமைவாக தயார்படுத்தப்பட்ட விண்ணப்பப்படிவத்தை அனுப்பி வைக்குமாறு அறிவித்துக்கொள்கின்றேன்.

**2017.02.15**
**மஹிந்த எஸ். வீரசூரிய**
**செயலாளர்,**
**கல்வி, தகவல்தொழில்நுட்பம் மற்றும் கலாசார**
**அலுவல்கள் அமைச்சு,**
**சப்ரகமுவ மாகாணம்.**